**මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම - 2016**

**--------------------------------------------------------------------------------**

මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම

**------------------**

1999 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය 1999 ජුනි 10 දින "මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම" යන නමින් රාජ්‍ය සමාගමක් ලෙස සංස්ථාපනය කර තිබුණි. 2012 සැප්තැම්බර් 12 දින මෙම සමාගම ඇවර කිරීමට මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් පසුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2013 නොවැම්බර් 20 දින අංක පීවී 22402 යටතේ සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කර තිබුණි.

**1.5** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1** **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් පරිදි අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) පරිච්ඡේද 3 හි 8 ඡේදය ප්‍රකාරව සමාගමේ ඉදිරි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) පරිච්ඡේද 33 හි 9 ඡේදය ප්‍රකාරව සමාගමට සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස්කර තිබුණු කළමනාකරණ සහකාරවරයෙකු වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සමාගමේ අරමුදලින් ගෙවන ලද රු.1,242,000 ක වැටුප් අධිකාරියෙන් ලැබියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) හඳුනානොගත් අන්තර් ගොවිපල ණයගැති ශේෂ වටිනාකම රු.35,682,485 ක් අවිනිශ්චිත ගිණුමක ඇතුලත් කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලනය කර තිබුණි.

**2.2.3** **පැහැදිලි නොකල වෙනස්කම්**

මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම රු. 88,183,837 ක් වුවද ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු. 88,094,019 ක් වීමෙන් රු. 89,818 ක වෙනසක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු | |
| මහවැලි ආර්ථික ඒජන්සිය | 405,218,731 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කර ඇති මෙම වටිනාකම් සනාථකර ගැනීමට හා ගිණුම් ගත කිරීමට අදාල ලියවිලි |
| කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | |
| යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | |
| විදේශ ආධාර | 5,729,782 | |
| ස්ථාවර වත්කම් කපාහැරීම් | 859,256 | වටිනාකම සකස් වූ ආකාරය හා අදාල අනුමැතිය |
| ලැබියයුතු ගිණුම් - මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම | 1,382,468 | වටිනාකම සනාථකර ගැනීමට අදාල ලියවිලි |

**2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට පවරා තිබුණු නිරාවිය ගොවිපලේ පශු සම්පත් තොගය වෙනුවෙන් ලැබිය යුතු රු.5,820,430 ක් අයකර ගැනීමකින් තොරව ලැබියයුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 ක කාලයක් ඉක්මවූ රු.690,784 ක ණයගිම් ශේෂ නිරවුල් කර නොතිබුණු අතර එම වටිනාකම් සනාථකර ගැනීමට අදාල සාක්ෂි සමාගම සතු නොවීය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන යම් ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයන්ගෙන් සහ කොටස්කාර අධ්‍යක්ෂවරයන්ගෙන් සැදුම්ලත් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. |

| | |
|---|---|
| (ii) 45 (1) වගන්තිය | අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, අධ්‍යක්ෂකවරුන් අතුරෙන් එක් අයෙකු සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත්කරගත යුතු වුවද 2015 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට සමාගමට සභාපතිවරයෙකු පත්කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,025,739 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,043,943 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,069,682 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් උපයන ලද ලාභය රු.3,662,109 කින් අඩුවීම හා වියදම් රු.1,407,573 කින් වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.16,603,787 ක්ව පැවැති සමාගමේ ශුද්ධ ලාභය 2016 වර්ෂයේදී රු.4,025,739 ක ශුද්ධ අලාභයක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් හා ආදායම් බදු නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.30,769,604 ක්ව පැවති සමාගමේ දායකත්වය අඛණ්ඩව අඩුවෙමින් සමාලෝචිත වර්ෂයේදී රු.7,782,072 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව, ඌරන්, කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී රු.8,407,159 ක් වටිනා කුකුළු කෑම හා රු.2,278,000 ක් වටිනා කුකුළු පැටවුන් 19,000 ක් මිලදී ගෙන තිබුණි. කුකුළු පැටවුන් විවිධ ආයතනවලින් මිලදී ගැනීම හේතුවෙන් පැටවෙකුගේ මිල රු.70 සිට රු.155 ක් අතර පරාසයක මිල විචලනයන් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිරාඳුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටුවා තිබුණු 1986 වර්ෂයේ දී ආරම්භකරන ලද කිරි සැකසුම්හලෙහි ආරම්භයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මඟින් නිෂ්පාදන කටයුතු කරගෙනයාම, කර්මාන්තශාලා ගොඩනැගිලි පැරණිවීම , වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලාව තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීම් පද්ධතිය දුර්වලව පැවතීම නිසා සෞඛ්‍යාරක්ෂිත ගැටළු පැනනැගී තිබුණි. මෙලෙස, දුර්වල පරිසර තත්ත්වයන් මත නිෂ්පාදන කාර්යයන් සිදුකිරීම නිසා ඉදිරියේදී නීතිමය ගැටළු පැනනැගීමට හැකිබව නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට රු. 8,237,607 ක් හා සේවක භාරකාර අරමුදලට රු. 334,846 ක දායක මුදලක් ගෙවිය යුතුව පැවතීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.14,929,159 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 42 (1) වගන්තිය ප්‍රකාරව රු.100 ක් වූ සාමාන්‍ය කොටස්වලින් සමාගමේ ප්‍රාග්ධනය සමන්විත විය යුතු වුවද සමාගමේ සාංගමික සංස්ථාපත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු.10 කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණි. සමාගම ආරම්භ කිරීම සඳහා ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වූ වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණි. අනෙකුත් කොටස් 2016 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත්කර නොතිබුණු අතර මහවැලි අධිකාරියේ හිමිකාරිත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි. එම නිසා සමාගම සම්බන්ධයෙන් අධිකාරියේ හිමිකාරිත්වය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2015 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම සමාගම අධිකාරියේ පූර්ණ හිමිකම සහිත පරිපාලිත සමාගමක් ලෙස දක්වා තිබූ අතර, 1999 වර්ෂයේදී මෙම සමාගමෙහි රු.418,871,277 ක් ආයෝජනයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ඒ සඳහා කිසිදු ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබාදී නොතිබුණි.

(ඊ ) සමාගම ආරම්භ කළ 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් හා ගෙවීම් කිරීම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය නමින් සිදුකර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

1999 වර්ෂයේ සිට සමාගම යටතේ ගොවිපලවල් 07 ක් ක්‍රියාත්මක වී තිබුණද වර්තමානයේ දම්මින්න හා ගිරාඳුරුකෝට්ටේ යන ගොවිපල දෙක පමණක් සමාගමේ පාලනය යටතේ පැවතුණි. අනෙකුත් ගොවිපලවල් බාහිර පාර්ශවයන් වෙත පවරා තිබුණු අතර එම ගොවිපලවල් වලට අයත් වටිනාකම රු. 16,806,745 ක් වූ ගොඩනැගිලි හා රු.6,583,340 ක් වටිනා වාහන හා වෙනත් වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දේපල පිරියත උපකරණ ලෙස දක්වා තිබුණි. බාහිර පාර්ශවයන් වෙත ගොවිපලවල් පැවරීම සඳහා ලබාගත් අනුමැතීන්ද විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් 2014/15 වර්ෂවලදී රු.12,501,900 ක් වැයකර ඉදිකරනලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු.8,967,600 කට අගයකර 2016 පෙබරවාරි 08 දින මෙම සමාගමට පවරා දී තිබුණි. වෙනත් පාර්ශවයන් විසින් ඔවුන්ගේ අරමුණක් ඉටුකර ගැනීම සඳහා සකස් කර තිබුණු මෙම ඉදිකිරීම් සමාගමට පවරාදී තිබුණද, මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින් නිසා පවරා දුන් දිනයේ සිට එම වත්කම නිෂ්කාර්යව දිරාපත් වෙමින් තිබුණි.

(ආ) ගිරාදුරුකෝට්ටේ අක්කර 1,054 ක පමණ වූ ගොවිපල භූමියෙහි කිසිදු බෝගයක් වගා කර නොතිබූ අතර, සත්ත්ව පාලන කටයුතුද සුළු වශයෙන් සිදුකිරීම හේතුවෙන් භූමිය ඌන උපයෝජිතව පැවතුණි. තවද එහි පැවති කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවෙහි රු.2,720,000 ක් වටිනා ස්ථාවර වත්කම් 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණු අතර පිරිවැය රු.2,056,000 ක් වූ අබලන් වාහන 06 ක් හා යන්ත්‍රයක් ගිරාදුරුකෝට්ටේ ගොවිපල කාර්යාල භූමියෙහි නිෂ්කාර්යව තබා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාගම සතු නිරාවිය ගොවිපල 2010 ඔක්තෝබර් සිට රේඛීය අමාත්‍යාංශය යටතට ගෙන තිබූ අතර එම ගොවිපල වෙත අනුයුක්තව සිටි සමාගමේ සේවකයින් 06 දෙනෙකුගේ වැටුප්, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල්වල දායක මුදල් අමාත්‍යාංශය විසින් හා වර්තමානයේදී මහවැලි අධිකාරිය විසින් ගෙවමින් පැවතුණද මෙම සේවකයින් විධිමත් පරිදි මුදාහැරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම පිහිටුවීමේ අරමුණු ඉටුකරගැනීමට ඉදිරි සැලසුම් ඇතුළත්කර සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ කාර්යයන් නිසි පරිදි මෙහෙයවීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස්කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අයවැයගත දත්ත හා සත්‍ය දත්ත අතර විචලනය සියයට 14 සිට සියයට 100 දක්වා පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම. |
| (ආ) | ණයගැති හා ණයහිමි පාලනය | දිගුකාලයක් නිරවුල් නොවී පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | සමාගම සතු මානව සම්පත් බාහිර පාර්ශවයන්ට ලබාදීම නිසි කළමනාකරණයෙන් සිදුනොකිරීම. |
| (ඈ) | කාර්යසාධනය | සාංගමික සංස්ථාපත්‍රයේ සඳහන් සියළු අරමුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | වත්කම් පරිපාලනය | නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සහ වෙනත් පාර්ශවයන් සතු වත්කම් නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම. |